කළුතර ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
---------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින හා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 18 දින ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සෘජු බැර කිරීම් රු.18,040,677 ක් මුදල් ලැබීම් වශයෙන් සටහන් නොකිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය මුදල් ගිණුමේ ශේෂය රු.18,040,677 ක් අඩුවෙන් හා හිඟහිටි වෙනත් ආදායම් ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී අය කරන ලද රු.481,937 ක් වූ සේවක ණය වාරික මුදල 2018 වර්ෂයේ මුදල් ලැබීමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන් සේවක ණය ශේෂය රු.481,937 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම් වටිනාකම රු.2,880,960 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,460,910 ක් ලෙස ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.420,050 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ විගණන වාර්තාවේ 2.2.1 (ඔ) ඡේදය නිවැරදි කිරීම සඳහා කර්මාන්ත ණයහිමි රු.400,000 කින් හර කර සමුච්චිත අරමුදල රු.400,000 කින් බැර කිරීම හේතුවෙන් කර්මාන්ත ණයහිමියෝ රු.400,000 ක් අඩුවෙන් හා සමුච්චිත අරමුදල රු.400,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළව පුස්තකාල පොත් මිළදී ගැනීම් රු.264,796 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.129,703 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පුස්තකාල පොත් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් රු.135,093 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු ලබා සිටි සේවකයින්ගෙන් අයකර ගත් රු.87,561 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ආපසු ලැබීම් ලෙස වැටුප් හා දීමනා වලින් අඩුකර දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.87,561 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) වස්කඩුව පුස්තකාලය සඳහා 2017 වර්ෂයේ මාස 03 කට ආදාළව ගෙවිය යුතු රු.75,000 ක බදුකුලී සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා වර්ෂයේ වියදම රු.75,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ සේවක ණය පොලිය රු.54,857 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.54,857 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාළ කර්මාන්ත ණයහිමියෝ රු.44,395,170 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.44,366,170 ලෙස දැක්වීම හේතුවෙන් කර්මාන්ත ණයහිමියෝ රු.29,000 ක් අඩුවෙන් හා කර්මාන්ත වියදම රු.29,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාළ කර්මාන්ත ණයගැති වටිනාකම රු.19,289,945 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.19,260,945 ක් ලෙස දැක්වීම හේතුවෙන් කර්මාන්ත ණයගැතියෝ රු.29,000 ක් අඩුවෙන් හා කර්මාන්ත ආධාර රු.29,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා ශේෂය රු.45,762 ක් හා පොදු ගබඩා වියදම රු.27,929 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) විදුලි ජනක යන්ත්‍ර මිළදී ගැනීම සඳහා පිරිවිතර සකස් කිරීම හා උපදේශනසේවා සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවිය යුතු රු.26,638 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා වර්ෂයේ වියදම හා විවිධ ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2017 දෙසැම්බර් මාසයට අදාළ රු.22,874 ක් වූ හිඟ වැටුප් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා විවිධ ණයහිමියෝ සහ වර්ෂයේ වියදම රු.22,874 බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයට අදාළ පුස්තකාල පොත් පරිත්‍යාග වටිනාකම රු.101,565 ක් වුවත් රු.89,240 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් පුස්තකාල පොත් හා ප්‍රාග්ධන ආධාර රු.12,325 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂය අවසානයට විදුලි ගබඩා තොග ශේෂය රු.15,100 ක් අඩුවෙන් හා විදුලි භාණ්ඩ වියදම රු.15,100 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ට) 2017 වර්ෂයේ වෙන්දේසි කරනු ලැබූ ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල පිරිවැය අගය කර ස්ථාවර වත්කම් ලේඛනවලින් හා ඉන්වෙන්ට්‍රි ලේඛනවලින් ඉවත් කර නොතිබුණි.

1:3:2 **<u>නොසැසඳුණු ගිණුම්</u>**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 34,567,343 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 6,196,458 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

1.3.3 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

<u>ගෙවිය යුතු ගිණුම්</u>

2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගයමත බදු හා ජාතිය ගොඩ නැගීමේ බදු පිළිවෙලින් රු.285,883 ක් හා රු.9,061 ක් විය.

1.3.4 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

ස්ථාවර වත්කම් ලේඛනය, ණයගැති ලේඛනය, අත්තිකාරම් ලේඛන, ණයහිමි ලේඛන, තැන්පත් ලේඛන හා උපලේඛන නොමැති වීම නිසා එකතුව රු.108,266,562 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ---------------------------------- | -------------- | ------------------- |
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| (i) 149 වගන්තිය | ---- | 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන්පොලකින් එම ආයතනවල මුළු ආදායමින් සියයට එක දක්වා වූ ගාස්තුවක් අයකර නොතිබුණි. |
| (ii) 160 වගන්තිය | ---- | හිඟ වරිපනම් බදු අයකරගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරීම් කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | ---- | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඈ) | 2,556 | නිකුත් කර ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 6 ඉක්මවා තිබූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 (1) හා (2) | 4,266,777 | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර කල් ඉකුත් වූ තැන්පත් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | ---- | සභා වාහන වල ඉන්ධන දැවීම් පරීක්ෂා කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,410,156 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.44,588,304 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 9,089,547 | 10,369,403 | 9,509,836 | 4,272,342 | 9,091,147 | 10,234,254 | 11,872,642 | 4,618,480 |
| (ii) කුලී | 240,000 | 229,800 | 270,300 | 12,000 | 150,000 | 156,000 | 373,500 | 52,500 |
| (iii) බලපත්‍ර ගාස්තු | 602,000 | 3,927,666 | 3,927,666 | - | 2,000,000 | 1,966,395 | 1,966,395 | - |
| (iv)වෙනත් ආදායම් | 13,000,000 | 13,000,000 | 39,781,266 | 69,761,925 | 41,000,000 | 41,000,000 | 11,930,452 | 141,041,660 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.145,712,640 ක් වූ අතර වර්ෂයට අදාළ බිල් කිරීම රු.27,526,869 ක් විය. වර්ෂය තුළ ලැබීම්, කපා හැරීම් හා ගැලපුම් වටිනාකම රු.99,193,242 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ ආදායම රු.74,046,267 ක් විය. 2018 ජූලි 31 වනවිට මෙම හිඟයෙන් රු.66,118,558 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හිඟය රු.4,548,410 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.3,782,136 ක් හෙවත් සියයට 83 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම් රු.9,286,281 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.6,569,574 ක් හෙවත් සියයට 71 ක් පමණක් අය කර ගෙන තිබුණි. වර්ෂය අවසානයට වරිපනම් හිඟය රු.4,267,702 ක් වූ අතර ඉන් පෙර වර්ෂයන්ට අදාළ හිඟය රු.975,659 ක් හා ප්‍රවර්තන හිඟය රු.3,292,043 ක් විය.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂයෙන් අවුරුදු 10 ට වඩා හිඟ ශේෂය රු.528,298 ක් වූ අතර අවුරුදු 5 ත් 10 ත් අතර හිඟ ශේෂය රු.638,010 ක් විය.

(ආ) බලපත්‍ර ගාස්තු

(i) සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල් හා ආපන ශාලාවලින් සියයට එක දක්වා වූ බලපත්‍ර ගාස්තු අය කර ගැනීමේදී හෝටල් 10 ක් සඳහා 2017 වර්ෂයේ වරලත් ගණකාධිකාරීවරයකු සහතික කරන ලද ගිණුම් ලබා ගෙන නොතිබුණි.

(ii) ශාලිමාර් හෝටලය සඳහා 2016 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තුව රු.75,103 ක් අඩුවෙන් අයකර තිබුණු අතර 2017 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය නිකුත්කර නොතිබුණි.

2.2.4 ත්‍රීරෝද රථ ආදායම්

(අ) සභා බල ප්‍රදේශයේ ත්‍රී රෝද රථ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) 2011 සැප්තැම්බර් 29 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවට අනුව එක් එක් ත්‍රී රෝද රථ ගාල්වල තැබිය හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව දක්වා තිබුණද එකී ප්‍රමාණය ඉක්මවා ත්‍රී රෝද රථ නවතා තැබීම සඳහා බලපත්‍ර නිකුත් කර තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.4,000,000 ක් හා මුද්දර ගාස්තු රු.65,761,925 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

2017 වර්ෂය තුළදී රු.24,215,081 ක් වූ සභා කර්මාන්ත 50 ක් ඉටුකර ඇතත් එම කර්මාන්ත කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයේ එක් රැස් වන කසළ කළුතර නගර සභාව වෙත භාර දෙනු ලබන අතර ඒ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී කසළ බැහැර කිරීම සඳහා රු.2,143,799 ක වියදමක් දරා තිබූ නමුත් එම පිරිවැය ආවරණය කිරීම සඳහා කසළ බදු පනවා නොතිබුණි.

(ii) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 ජූලි 31 දින වන විටත් සකස් කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

(ආ) පුරප්පාඩු පැවති ලේකම් තනතුරේ වැඩ ආවරණය සඳහා කළමනාකරණ සහකාර 1 ශ්‍රේණියේ නිලධාරිණියක පත්කර තිබුණි.

(ඇ) තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුරක්, කාර්යාල කාර්ය සහායක තනතුරක්, ක්ෂේත්‍ර කම්කරු හතර දෙනෙක්, ආදාහනාගාර ක්‍රියාකරු සහායක හා පෙර පාසල් ගුරු තනතුරු 02 ක පුරප්පාඩු පැවතුණි.

(ඇ) ද්විතීයික මට්ටමේ තනතුරු 03 ක් සඳහා සේවකයින් 05 දෙනෙකුගේ හා තෘතීය මට්ටමේ තනතුරු 02 ක් සඳහා සේවකයින් 03 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ඉ) සේවකයින් 05 දෙනෙකු අනියම් හා ආදේශක තනතුරු සඳහා බඳවා ගෙන තිබුණි.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

උප පත්‍රිකා පොත් නිකුත් කිරීම

(i) වස්කඩුව උප කාර්යාලය සඳහා ගබඩාවෙන් නිකුත් කරනු ලබන උප පත්‍රිකා පොත් එම කාර්යාලයේ උප පත්‍රිකා පොත් ලේඛනයේ සටහන්ව නොතිබූ අතර පොත් නිකුත් කිරීමේදීද අංක අනුපිළිවෙලට නිකුත් කිරීම් සිදු කර නොතිබුණි.

(ii) වස්කඩුව උප කාර්යාලයේ උප කුවිතාන්සි පොත් ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර ක්ෂේත්‍රයේ මුදල් එකතු කරනු ලබන නිලධාරීන් වෙත නිකුත් කළ හා ආපසු භාරදුන් උප කුවිතාන්සි පොත් පිළිබඳ විස්තර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.356,250 ක් වටිනා ලී බඩු හා සවිකිරීම් හා රු.2,880,960 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබුණි.

3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

(අ) 2007 වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලැබී තිබූ විදුලි ජනක යන්ත්‍රය 2014 වර්ෂයේ රු.77,500 වැය කර අළුත්වැඩියා සිදුකර තිබුණත් එදින සිට 2018 ජූලි 15 දිනය දක්වාම අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 15 දින මිලදී ගත් රු.591,300 ක් වටිනා 80/100 තාර බැරල් 45 ක ප්‍රමාණයක් කිසිදු කර්මාන්තයකට යොදවා නොගෙන වර්ෂය පුරා ගබඩාවේ රඳවා තබාගෙන තිබුණි.

3.5 ප්‍රසම්පාදනය

3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය

ගංකන්ද සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම

විමධ්‍යගත ප්‍රතිපාදන මත ගංකන්ද සේවා මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.4,375,538 ක ඇස්තමේන්තුවක් මත 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණද 2017 දෙසැම්බර් දක්වාම ඉදිකිරීම් නිම කර නොතිබුණි.

(අ) 2016 දෙසැම්බර් 30 දින වන විට රු.2,944,018 ක වැඩ නිම කර අවසන් ගෙවීම් ලෙස රු.1,076,500 ක් ගෙවා තිබුණද, 2018 සැප්තැම්බර් 17 වන විටත් ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර නොතිබුණි.

(ආ) අවසන් ගෙවීම සිදුකර තිබුණද එකී ගොඩනැගිල්ලට විදුලිය සපයා නොතිබුණි. තවද එකී ගොඩනැගිල්ලට සනීපාරක්ෂක පහසුකම්ද සපයා නොමැති බැවින් වසරක පමණ කාලයක් පුරා එකී ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි.

(ඇ) මෙම ගොඩනැගිල්ලට සවි කිරීම සඳහා සපයා තිබූ 1/2" බීජ් කරාම දෙකක්, සෝදන බේසමක්, ප්‍රතිදීප්ත විදුලි බල්බ 11 ක් සහ සීලිං විදුලි පංකා 04 ක් ගබඩාවේ නිශ්ක්‍රීයව තබා තිබුණි.

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය</u>

4.1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත හා තථ්‍ය ආදායම සියයට 15 සිට සියයට 220 දක්වා සහ වියදම සියයට 21.3 සිට සියයට 82 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 <u>පළාත් ගිණුම් කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක නොකිරීම.</u>

2018 මාර්තු 29 දින පැවති පළාත් ගිණුම් කාරක සභාව විසින් කර තිබෙන පහත සඳහන් නියෝග 2018 ජූලි 15 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) 2011 විගණකාධිපති වාර්තාවේ 2.2.2 (ඇ) ඡේදයෙහි වෙළඳ බලපත්‍ර කපා හැරීම රු.26,685 ක්, ව්‍යාපාර බදු කපා හැරීම රු.60,760 ක් හා කර්මාන්ත බදු කපා හැරීම රු.43,070 කට අදාළව අනුගමනය කළ ක්‍රමවේදය පිළිබඳව සම්පූර්ණ ලේඛන සහිතව විධිමත් වාර්තාවක් ඉදිරිපත් කිරීම.

(ආ) 2011 ජූලි සිට 2011 සැප්තැම්බර් දක්වා මිලදී ගෙන තිබූ ටයර් 47 ක් සහ බැටරි 09 ක් වාහන වලට යෙදීමේදී ගලවා ඉවත් කරන ලද ටයර් හා බැටරි වලට අදාළ නිවැරදි වාර්තාවක් ඉදිරිපත් කිරීම.

(ඇ) 2012 විගණකාධිපති වාර්තාවේ 2.3 ඡේදයට අනුව 2009 ජූනි 29 දින සිට අක්‍රීය තත්ත්වයේ පැවති ගල්රෝල සම්බන්ධයෙන් තක්සේරු වාර්තාවක් ලබා ගෙන වෙන්දේසි කර වාර්තා කිරීම.

(ඈ) 2012 විගණකාධිපති වාර්තාවේ 2.5 ඡේදයට අනුව ඇටවිල ආදාහනාගාරය පළවෙනි සභාවාරයේදී විවෘත කිරීම පිළිබඳ තිරණයක් ලබා ගෙන වාර්තාවක් ඉදිරිපත් කිරීම.

(ඉ) 2012 විගණකාධිපති වාර්තාවේ 2.6 (ඉ)(iv) ට අනුව අංක 251 – 2837 වාහනයේ රිය අනතුර සම්බන්ධයෙන් නැවත පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කිරීම.

5. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම්වලින් අත්හැරීම් හා අඩුවෙන් හා වැඩියෙන් සටහන් වීම් තිබීම. |
| | | (ii) | ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ආ) | වත්කම්/දේපළ | (i) | ලේඛනගත නොකිරීම. |
| | | (ii) | ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ බදු අයකිරීම ප්‍රමාණවත් පරිදි සිදු නොකිරීම. |
| (ඈ) | ණයගැති/ණයහිමි | (i) | උපලේඛන පිළියෙල නොකිරීම. |
| | | (ii) | කාල විශ්ලේෂණ පිලියෙල නොකිරීම. |
| (ඉ) | සේවක කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම. |
| | | (ii) | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |
| (ඊ) | අයවැය පාලනය | (i) | අයවැය ගත හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම. |
| | | (ii) | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම. |